C
374
ABE

# ශ්‍රී ලංකාවේ පාසල් හි පහසුකම් හා සේවා ගාස්තු කළමනාකරණය

# The Management of Facilities and Service Fees in Sri Lankan Schools

**මල්කාන්ති අබේගුණසේකර**

ශාස්ත්‍රවේදී (විශේෂ උපාධිය)

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය

අධ්‍යාපන දර්ශනපති උපාධි ( M.phil.) නිබන්ධනය

අධ්‍යාපන විද්‍යා අධ්‍යයනාංශය

පේරාදෙණිය විශ්ව විද්‍යාලය

පේරාදෙණිය

ශ්‍රී ලංකාව

පර්යේෂණ උපදේශක :

**ආචාර්ය ප්‍රසාද් සේතුංග**

අධ්‍යාපන විද්‍යා අධ්‍යයනාංශය

පේරාදෙණිය විශ්ව විද්‍යාලය

පේරාදෙණිය

593408

# සාරාංශය

සමස්ත අධ්‍යාපන ක්‍රියාවලියේ වඩාත් සජීවී ඒකකය වශයෙන් සුවිශේෂී ස්ථානයක් පාසලට හිමි වේ. කුසලතා සහ දක්ෂතා පිරිපුන් දරු පරපුරක් අනාගතයට දායාද කිරීම පාසල් අධ්‍යාපනයේ මූලික අරමුණ වේ.

පාසල් කළමනාකරණය තුලින් මේ සඳහා අවශ්‍ය පසුබිම සකස් කළ යුතුව ඇත. පාසල් කළමනාකරණයේ අනෙකුත් අංශවල මෙන්ම මූල්‍ය කළමනාකරණය පාසල් සංවර්ධනයට අත්‍යවශ්‍ය අංගයකි. පරිපාලනමය චක්‍රලේඛ, රෙගුලාසි, නීති රීති මගින් මෙන්ම ආයතනමය වශයෙන් උද්ගත වන වෙනත් තත්වයන් නිසාද මූල්‍ය කළමනාකරණය තුළ ගැටළු පැන නැගී ඇති බව පෙනේ. මෙසේ පාසල් කළමනාකරණයේදී තීරණ ගැනීමට අහිතකරව බලපෑම නෛතික සීමා ගැටලු වශයෙන් තව දුරටත් පැවතීම පාසල් සංවර්ධනයට බාධාවකි. මේ නිසා පාසල් සංවර්ධනයට අත්‍යවශ්‍ය අරමුදලක් වන පහසුකම් හා සේවා ගාස්තු පිළිබඳව දැනට පවතින ගැටළු හා එම මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යයනය වඩා වැදගත් වේ.

ඒ අනුව පහසුකම් හා සේවා ගාස්තු එකතු කිරීම,ගිණුම් තැබීම හා පවත්ගෙන යාම සහ වියදම් කිරීම පිළිබඳ දළ හැඳින්වීමක් මෙම නිබන්ධනයෙහි පළමු පරිච්ඡේදයෙහි ඇතුළත් වේ. දෙවන පරිච්ඡේදයෙහි අන්තර්ගත වන්නේ අධ්‍යයනයට අදාළ පෙර සාහිත්‍ය විමර්ශනයකි. තෙවන පරිච්ඡේදය වෙන් කරන ලද්දේ පර්යේෂණ ක්‍රමවේදය පැහැදිලි කිරීම උදෙසා ය. මෙම අධ්‍යයනයට අදාළව නියැදියේ දත්ත ඉදිරිපත් කරමින් එම දත්ත සඳහා සිව් වන පරිච්ඡේදය වෙන් කෙරේ. අවසාන පරිච්ඡේදයේදි අධ්‍යයනය මගින් අනාවරණය වු කරුණු විග්‍රහ කිරීමත්, නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීමත් සිදු කෙරේ.

මෙහිදී මෙම අධ්‍යයනය විස්තරාත්මක පර්යේෂණ ක්‍රමයට අදාළව සිදු කෙරුණු අතර එතුළින් වත්මන් අධ්‍යාපන පද්ධතිය තුළ පහසුකම් හා සේවා ගාස්තු කළමනාකරණය පිළිබඳව තොරතුරු අනාවරණය කර ගැනුණි.

මෙම පර්යේෂණය තුළින් හඳුනාගත් මූලික කරුණු කීපයක් මෙසේ දැක්විය හැකිය. පහසුකම් හා සේවා ගාස්තු අය කිරීමේදී සිසුන්ට බලපෑම් කිරීමට නොහැකිවීම , සිසුන් විසින් ගෙවීම් පැහැර හැරීම, දෙමව්පිය ආර්ථික අපහසුතා සහ ගාස්තු ගෙවීමට ක්‍රියාත්මක නොවීම, අය කරනු ලබන මුදල ප්‍රමාණවත් නොවීම, ගුරුවරු මෙම ගාස්තු වුවමනාවෙන් හා උනන්දුවෙන් එකතු නොකිරීම සහ ඇතැම් විදුහල්පතිවරුන් මෙම අයකිරීම අනවශ්‍ය කරදරයක් යැයි සිතීම වැනි ගැටළු සමස්තයක් ලෙස දැක්විය හැකිය.

ගිණුම් පවත්වාගෙන යාමේදී ගිණුම් කටයුතු සම්බන්ධව දැනුම ඇති ගුරුවරුන් ඇතැම් පාසල්වල නොමැති වීම, ගිණුම් කටයුතු මත අනවශ්‍ය වගකීම් විදුහල්පතිවරුන් වෙත පවරා තිබීම හා ඒවායේ කිසියම් අඩුපාඩුවක් ඇති වූ විට විගණන විමසුම් වලට ලක්වීම වැනි අපහසුතාවන්ට මුහුණ දීමට සිදුවීම, මෙම ගාස්තු පිළිබඳ ගිණුම් සංකීර්ණ ක්‍රියාවලියක් වීම, ගිණුම් පවත්වාගෙන යාමට අවශ්‍ය කාලය පාසල සඳහා වැයකළ හැකි කාලයෙන් යොදාගැනීමට සිදුවීම. වෙනත් ගිණුම් රාශියක් පාසලේ පවත්වාගෙන යාමට සිදුවීම, වැනි ගැටළුවලට මුහුණදීමට සිදුවී ඇති බව පැහැදිලි වේ.

පහසුකම් හා සේවා ගාස්තු ගිණුම් පවත්වාගෙන යාමේදී ඒ පිළිබඳ නෛතික මූලාශ්‍ර වශයෙන් පාර්ලිමේන්තු ආඥාපනත් , ගැසට් නිවේදන හා චක්‍රලේඛ නියෝග දක්නට ඇත. මේ අනුව මුදල් වියදම් කිරීමේදී නීතියෙන් ලැබෙන ඉඩකඩ ප්‍රමාණවත් නොවන බව පෙනේ. ගාස්තු වැයකිරීම පාසල් මට්ටමේදී පොදුවේ සිදු වන නිසා වුවමනාවෙන් ගාස්තු නොගෙවා සිටින සිසුන්ටද එහි වරප්‍රසාද භුක්ති විදිය හැකි බව පෙනේ. එසේම පහසුකම් හා සේවා ගාස්තු හැර වෙනත් ඉපැයීම් තුළින් එම අරමුදල ශක්තිමත් කරගැනීමට විදුහල්පතිවරුන් උනන්දුවක් නොදක්වයි. එසේම විදුහල්පතිවරුන්ගෙන් සිදුවිය හැකි අඩුපාඩු කාර්යාල හා විගණන අධීක්ෂණයට පහසු විය යුතුයි. එසේම වර්ෂ අවසානයේ අයවැය වර්තා සැකසීමේදී පුරුද්දක් නොමැති බැවින් ප්‍රගති සමාලෝචනයන්ද නොකෙරේ. දැනට බලපවත්වන චක්‍රලේඛයද අවුරුදු. 28කින් සංශෝධනයන්ට යටත් නොවී ඇති බැවින් එයද වර්තමානයට ගැලපෙන ලෙස සංශෝධනය විය යුතුය.

මේ අනුව පාසල් මූල්‍ය කළමනාකරණය තුළ පහසුකම් හා සේවා ගාස්තු ආශ්‍රිත ගැටළු පවතින බවත් , ඒවා මග හරවා ගැනීමට විසඳුම් ලබාදිය හැකි බවත් අනාවරණය විය. එය අනාගත පාසල් පද්ධතිය තුළ මතු විය හැකි ගැටළු අවම කර ගැනීමට ඉවහල් වන බව මෙයින් පැහැදිලි ය. එහෙයින් අනාගත පාසල් පද්ධතිය සඳහා මෙම අධ්‍යයනයෙන් ගත හැකි ආදර්ශ බොහෝ තිබිය හැකි ය. පසු පර්යේෂණ කාර්යය සඳහා මං පෑදීම තුළින් ද පාසල් මූල්‍ය කළමනාකරණය සඳහා ආදර්ශ ලබා ගත හැකි අවස්ථා එළඹෙනු ඇත.

## SUMMARY

The Fundamental goal of education is to endow the future a generation of children with full skills and competencies to enrich the nation towards a more civilized society. Achieving the above goal the school plays a vital role.

Financial management is an essential feature among the other aspects of school management. It is obvious that problem have arisen in the financial management due to administrative circulars, financial rules and regulations, in the conventional and restrictive administrative regulations and financial regulations of the state and due to other conditions arising on institutional backgrounds.

The imposition of legal restrictions of various rules and regulations of the administrative regulations and financial regulations affects the decision making process of the school management. Hence, it is important to focus more attention on the study of prevailing problems, regarding the funds, the school facilities and the services fees levied from the students as another essential financial source that can be utilized in the development of school.

The first chapter of this dissertation includes a brief introduction on collection and expenditure of the school facilities and service fees and also keeping and maintaining of accounts as an essential financial source in the development of school.

The second chapter contains about the literature review references relevant to the study. The third chapter is for the purpose of explaining the research methodology. The presentation of data analysis, explaining the data of the sample, relevant to the study is enumerated in the forth chapter.

The final chapter gives the data analysis, revealed in the study and the presentation of conclusions and suggestions.

In this study, facts concerning the managements of school facilities and service fees in the present education system have been revealed. The basic points that were revealed from the research are given below.

There is no possibility to force the students in charging the facility and services fees. Students' neglect paying fees & most parents do not pay fees due to economical problems. The amount, charged from students is not sufficient at all. Teachers are not interested in collecting fees. Some principals think that the collection of fees in an unnecessary burden for them.

We don't find the teachers in same schools, who have the knowledge of keeping accounts, Principals are given unnecessary responsible, and also they have to face audit inquiries of there are any shortcomings. Keeping accounts in a school is a very complicated process. The time for keeping various types of accounts is taken from the school hours.

There are parliamentary acts, gazettes notices and circulars as legal sources for keeping accounts of facilities & services fees. It is obvious that the prevailing regulations are not sufficient to spend money for certain necessary things are the school. And also student can enjoy the school benefits, even without paying fees purposely.

The principals do not try to strengths the funds in the school by extra earning, except facilities & service fees. The shortcomings done by the principals should be supervised by the office and audit. And there is no habit of preparing annual budget regularly and the progress review is not done at the end of the year.

The present circular have not been amended for nearly 28 years. Therefore they have to be changed to suit the present needs of the school system.